ලොරි රථයක සකස් කළ රහසිගත කුටියක සඟවාගෙන අධිබල පුපුරණ ද්‍රව්‍ය තොගයක් ප්‍රවාහනය කරමින් සිටි දෙදෙනෙකු බිංගිරියේදී අත්අඩංගුවට ගැනීමේ පුවතක් මාධ්‍ය තුළ වාර්තා වී තිබිණි. ජන. 25, 2023 දින සිංහල භාෂා පුවත්පත් තුළ ඒ සම්බන්ධයෙන් වාර්තා වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.
අත්අඩංගුවට ගැනුණු සැකකරුවන්ගේ වාර්ගිකත්වයක් නොදක්වයි - අද, දිනමිණ, ලංකාදීප
අත්අඩංගුවට ගැනුණු සැකකරුවන්ගේ වාර්ගිකත්වය "දෙමළ" යැයි දක්වයි - දිවයින, මව්බිම
මාධ්‍ය ආචාර ධර්ම ඔස්සේ මාධ්‍යවේදීන්ට උපදෙස් ලබාදෙන්නේ, පුවතකට සෘජුව අදාළ නොවන්නේ නම්, යමෙකුගේ වාර්ගිකත්වයන් සඳහන් නොකරන ලෙසයි.
ඒ අනුව,
1) මෙම පුවතට, අදාළ සැකකරුවන්ගේ වාර්ගිකත්වය අදාළ යැයි ඔබ සිතන්නේ ද?
2) එසේ අදාළ නොවන්නේ නම්, ඇතැම් පුවත් වාර්තාවන් තුළ මෙම සැකකරුවන් "දෙමළ" යැයි හඳුන්වන්නේ මන්ද?
3) ඇතැම් පුවත්පත් එම පුවතම සැකකරුවන්ගේ වාර්ගිකත්වයන් ඉස්මතු නොකරමින් පුවත වාර්තා කරන්නේ නම්, වාර්ගිකත්වය පුවතට අදාළ විය හැකිද?
4) එසේ අදාළ නොවන වාර්ගිකත්වයන් ඉස්මතු කොට දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික (negatively stereotype) වීමේ ඉඩක් නොමැතිද?
මූලාශ්‍ර:
https://www.editorscode.org.uk/the_code.php
https://accountablejournalism.org/.../nuj-race-reporting...
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
***අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

**බිංගිරියේ ලොරි රථයක පුපුරන ද්‍රව්‍ය හමුවීම පිළිබඳ පුවත**
**සැකකරුවන්ගේ වාර්ගිකත්වය සඳහන් කළ සහ නොකළ පුවත්පත්**

| පුවත්පත | වාර්තා කළ ආකාරය |
|---|---|
| දිවයින | වාර්ගිකත්වය සඳහන් කර ඇත. |
| මව්බිම | වාර්ගිකත්වය සඳහන් කර ඇත. |
| දිනමිණ | වාර්ගිකත්වය සඳහන් කර නැත. |
| අද | වාර්ගිකත්වය සඳහන් කර නැත. |
| ලංකාදීප | වාර්ගිකත්වය සඳහන් කර නැත. |
| අරුණ | පුවත වාර්තා කොට නැත. |

ජනවාරි 25, 2023 දින පුවත්පත් දත්ත ඇසුරිණි.